ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදි (ගෞරව) උපාධි පාඨමාලාව- 03 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2023/2024

නීති ක්‍රම සහ නීති රචනය -LLU3602

කාලය : පැය තුනයි (03)

දිනය : 2025 මැයි 10 වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30

මුළු ප්‍රශ්න ගණන : අටයි (08)

I කොටසින් ප්‍රශ්න දෙකක්( 02) සහ II කොටසින් ප්‍රශ්න තුනක්(03) ද ඇතුළුව මුළු ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

## I කොටස- නීති රචනය

මෙම කොටසින් ඕනෑම ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

1. (i). විවිධ නීතිමය මූලාශ්‍ර වර්ග මොනවාද යන්න හඳුනාගෙන සුදුසු උදාහරණ දක්වමින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii). පහත සඳහන් ඕනෑම කියවීමේ ශිල්පීය ක්‍රම දෙකක් (02) පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

අ. පිරික්සා බැලීම (Scanning )

ආ. පිටපත් කිරීම (Skimming)

ඇ. අවධානය යොමු කළ කියවීම (Focused reading)

(ලකුණු 10)

(10 + 10 = ලකුණු 20)

2. (i). සාර්ථක නීතිමය තර්කයක් ගොඩනැගීමට අවශ්‍ය කුසලතා පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii). IRAC ක්‍රමයේ විවිධ කොටස් හඳුනා ගෙන ඒවා සාර්ථක නීතිමය තර්කයක් ගොඩනැගීමට දායක වන ආකාරය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)

(10 + 10 = ලකුණු 20)

3. (i). ශාස්ත්‍රීය සුපිළිපන්භාවයේ(Academic integrity) වටිනාකම හඳුනා ගන්න.

(ලකුණු 10)

(ii). විවිධ ආකාරයන්හි රචනා චෞරත්වය (plagiarism) පිළිබඳ ව සාකච්ඡා කර නිසි අයුරින් මූලාශ්‍ර දැක්වීම මෙය වළක්වා ගැනීමට උපකාරී වන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(10 + 10 = ලකුණු 20)

**<u>II කොටස- නීති ක්‍රම</u>**

**මෙම කොටසින් ඕනෑම ප්‍රශ්න <u>තුනකට(03)</u> පමණක් පිළිතුරු සපයන්න.**

4. සමන් සහ නිරෝෂා යන දෙදෙනාම ග්‍රාමීය ප්‍රදේශයක පිහිටි ඉඩමක් උරුම කරගත් සහෝදර සහෝදරියෝ වෙති. ඔවුන්ගේ අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මිය ගිය පියාගේ දේපළට. උරුමය පිළිබඳ කාරණාවලදී පුතුන්ට ප්‍රමුඛත්වය ලබා දෙන දිගුකාලීන චාරිත්‍රයක් එම ගමෙහි තිබූ අතර ඒ මත පදනම්ව සමන් මුළු දේපළටම හිමිකම් කියාපෑම නිසා අර්බුදයක් උද්ගත විය. ශ්‍රී ලංකාවේ අන්තිම කැමති පත්‍රයක් නොමැතිව අනුප්‍රාප්ත වීමේ සාමාන්‍ය නීතිය යටතේ සහෝදර සහෝදරියන් සමානව උරුමය ලබන බවට තර්ක කරමින් නිරෝෂා මෙයට අභියෝග කරයි.

සමන් තර්ක කරන්නේ එම සිරිත ඔවුන්ගේ ගමේ පරම්පරා ගණනාවක් තිස්සේ අනුගමනය කර ඇති බවත් එය දේශීය ප්‍රජාව විසින් බන්ධනීය ආකාරයෙන් පිළිගෙන ඇති බවත්ය. එසේම ඔහු තවදුරටත් දක්වන්නේ ඔවුන්ගේ පවුලේ පෙර පරම්පරාවලද මෙම සිරිත නිරන්තරයෙන් පිළිගෙන ඇති බවයි. කෙසේ වෙතත්, නිරෝෂා පෙන්වා දෙන්නේ මෙම සිරිත කිසි විටෙකත් ලේඛණගතකර හෝ සංග්‍රහ කර නොමැති බවයි.

ප්‍රාදේශීය සිරිත් නීතියේ මූලාශ්‍රයක් ලෙස පිළිගැනීම සම්බන්ධයෙන් මෙම අවස්ථාවෙහි දී පැන නගින නීතිමය ගැටලු සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුරේ දී, සිරිතක් අධිකරණය විසින් පිළිගැනීමට ඇති අවශ්‍යතා සලකා බලා, ඉඩමට හිමිකම් පෑමක් තහවුරු කිරීම සඳහා සමන්ට චාරිත්‍රමය රීතිය මත විශ්වාසය තැබිය හැකි ද යන්න හඳුනා ගන්න.

(ලකුණු 20)

5. "අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය නීති පද්ධතිය තුළ අනුකූලතාව සහ පුරෝකථනය කිරීමේ හැකියාව සහතික කරයි, නමුත් එය නීතියේ වර්ධනයට බාධාවක් විය හැකිය."

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. ශ්‍රී ලංකාවෙ අධිකරණ පූර්ව නිදර්ශන න්‍යායේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු කරමින්, සුදුසු නඩු තීන්දු ඇසුරෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

6. "නීතිඥවරයෙකු යනු සේවාදායකයන්ගේ අයිතිවාසිකම්, වගකීම් සහ අවශ්‍යතා තහවුරු කිරීමට සහ ආරක්ෂා කිරීමට වන නියෝජිතයෙකි, විශ්වාසවන්ත උපදේශකයෙකු සහ අනුශාසකයෙකි,

යුක්තියේ ගුණාත්මක භාවය විශයෙහි විශේෂ වගකීමක් දරණ නීති පද්ධතියේ නිලධාරියෙකි, වෘත්තියක සාමාජිකයෙකි, එමෙන්ම සතුටුදායක ජීවිතයක් උපයා ගැනීමට උත්සාහ කරන නීතිගරුක පුරවැසියෙකි."

A.R.B. Amarasinghe, *Professional Ethics and responsibilities of Lawyers.*' (Lake House Investment Ltd, Colombo, 1993)

ඉහත ප්‍රකාශය සැලකිල්ලට ගනිමින්, නීතිය ක්‍රියාත්මක කිරීමේ දී නීතිඥ වෘත්තියේ කාර්යභාරය පැහැදිලි කරන්න.

**(ලකුණු 20)**

7. (i). නීති මූලාශ්‍රයක් ලෙස ජාත්‍යන්තර සම්මුතීන් වල පවත්නා වැදගත්කම සාකච්ඡා කරන්න.

**(ලකුණු 10)**

(ii). "ඒක න්‍යායවාදයේ සහ ද්විත්ව න්‍යායවාදයේ විවිධ ප්‍රභේද පවතී. කෙසේ වෙතත්, න්‍යායෙන් දෙකටම එල්ල වන ප්‍රධාන විවේචනයක් වන්නේ කිසිදු රාජ්‍යයක නීති පද්ධතියක් දැඩි ඒක න්‍යායවාදී හෝ ද්විත්ව න්‍යායවාදී නොවන බවයි."

M. Chiam, '*Monism and Dualism in International Law*' (Oxford Bibliographies, 2018)

දේශීය නීති පද්ධති තුළ අන්තර්ජාතික සම්මුතිගත බැඳියාවන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි ද්විත්ව න්‍යායවාදී සහ ඒක න්‍යායවාදී ප්‍රවේශයන් බලපාන ආකාරය විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

**(ලකුණු 10)**

**(10 + 10 = ලකුණු 20)**

8. පහත සඳහන් ඕනෑම දෙකක් **(02)** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

අ. නීතියේ මූලික මූලාශ්‍රය ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ආ. රෝම-ලන්දේසි නීතියේ වැදගත් මූලාශ්‍රයක් ලෙස නීතිවේදීන්ගේ අදහස්

ඇ. ශ්‍රී ලංකාවේ නීතියේ මූලාශ්‍රයක් ලෙස සාධාරණත්වය

**(10 + 10 = ලකුණු 20)**

*-සියළුම හිමිකම් ඇවිරිණි.-*